සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 11 - බුද්ධ ධර්මය
## අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය :** බහුවරණ ප්‍රශ්න 40 කි = (1 x 40) **ලකුණු 40 යි**

**II පත්‍රය :** 1 වැනි ප්‍රශ්නය කොටස් 10 කි කෙටි පිළිතුරු (2 x 10) **ලකුණු 20 යි**

(2 - 7 තෙක් තෝරාගත් ප්‍රශ්න 04 කට)

2 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

3 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

4 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

5 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

6 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 — ලකුණු 10 යි.

7 වැනි ප්‍රශ්නය එක් කොටසකට ලකුණු 5 බැගින්

(ලකුණු 5 X 2 ) ලකුණු 10 යි.

**ලකුණු 40 යි.**
**මුළු ලකුණු 100 යි.**

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | = 40 |
| II පත්‍රයට ලකුණු | = 60 |
| **මුළු ලකුණු** | = 100 |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **11**

විෂයය / பாடம்: **බුද්ධ ධර්මය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 1 | 31. | 3 |
| 02. | 1 | 12. | 2 | 22. | 4 | 32. | 3 |
| 03. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 3 |
| 05. | 2 | 15. | 3 | 25. | 1 | 35. | 3 |
| 06. | 3 | 16. | 4 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 1 | 27. | 3 | 37. | 4 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 1 |
| 09. | 2 | 19. | 1 | 29. | 2 | 39. | 3 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 11 - බුද්ධ ධර්මය

## II පත්‍රය

* **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1. (i) නාලාගිරි ඇතා දමනය කිරීමෙන් ප්‍රකට වන බුදු ගුණය කුමක් ද?**

පුරිසදම්ම සාරථී / පුරිසදම්ම සාරථී ගුණය / නොහික්මුණු පිරිස් දමනය කිරීම.

(ලකුණු 02යි)

**(ii) බුදුරජාණන් වහන්සේ පළමුවන හා දහවන වස්කාල ගතකළ ස්ථාන පිළිවෙළින් ලියා දක්වන්න.**

පළමුවන වස්කාලය:- බරණැස ඉසිපතන මිගදායේ දී / බරණැස ඉසිපතනයේ දී / ඉසිපතන මිගදායේ දී / ඉසිපතනයේ දී / මිගදායේ දී

දසවන වස්කාලය:- පාරිලෙය්‍යා වනයේ දී

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක ලබා දෙන්න.**

(ලකුණු 02යි)

**(iii) කර්මස්ථාන ලබා දීමේ දී සැලකිල්ලට ලක්කරන පුද්ගල චරිත වර්ගීකරණයට අයත් චරිත දෙකක් ලියා දක්වන්න.**

1. රාග චරිත
2. දෝස චරිත / ද්වේශ චරිත
3. මෝහ චරිත
4. සද්ධා චරිත / ශ්‍රද්ධා චරිත
5. බුද්ධි චරිත
6. විතක්ක චරිත / විතර්ක චරිත

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක ලබා දෙන්න.**

(ලකුණු 02යි)

**(iv) 'අනණ සුඛය' යන්නෙහි අර්ථය සැකෙවින් දක්වන්න.**

අනුන්ට ණය නැතිව විසීමෙන් ලැබෙන සැපය / ණය නොවී ජීවත්වීමේ සතුට / ණය නොවී සිටීම

(ලකුණු 02යි)

**(v) "ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" මෙම ගාථා පාඨයේ අර්ථය ලියන්න.**

ලාභයන් අතරින් නීරෝගී බව උතුම් ය. ධන සම්පත් අතරින් සතුට ශ්‍රේෂ්ඨය. / නීරෝගීකම පරම ලාභය වේ. සතුට පරම ධනය වේ. / නිරෝගීකම උතුම් ලාභයයි. සතුට උතුම් ධනයයි.

(ලකුණු 02යි)

**(vi) සිව් බඹ විහරණ නම් කරන්න.**

1. මෙත්තා - මෛත්‍රිය
2. කරුණා - කරුණාව
3. මුදිතා - මුදිතාව හෙවත් අනුන්ගේ දියුණුවේදී සතුටුවීම
4. උපෙක්ඛා - උපේක්ෂාව/ මැදහත් බව

**කරුණු 2/3 ට ලකුණු එකයි. කරුණු 4 ට ලකුණු දෙකයි**

**(ලකුණු 02යි)**

**(vii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි පූජ්‍ය පක්ෂය විසින් ගිහි ජනතාවට ඉටු කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.**

1. පවින් වැළැක්වීම
2. යහපතෙහි යෙදවීම
3. හොඳ සිතින්ම අනුකම්පා කිරීම
4. අසා නොමැති දහම් කරුණු කියාදීම
5. අසා ඇති දහම් කරුණු වඩාත් පැහැදිලි කර දීම.
6. සුගතියට මග පෙන්වීම

**පාලියෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න.**

**එක් කරුණකට ලකුණ බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙක දෙන්න.**

**(ලකුණු 02යි)**

**(viii) බුදු දහමේ දැක්වෙන සිව්වනක් පිරිස නම් කරන්න.**

1. භික්ඛු/ භික්ෂු
2. භික්ඛුණී/ භික්ෂුණී
3. උපාසක
4. උපාසිකා

**කරුණු 2/3 ට ලකුණු එකයි. කරුණු 4 ට ලකුණු දෙකයි.**

**(ලකුණු 02යි)**

**(ix) දිට්ඨධම්මවේදනීය කර්ම යන්නෙහි අර්ථය දක්වන්න.**

මෙලොවදී ම විපාක දෙන කුසලාකුසල කර්ම/ මේ ආත්ම භාවයේදීම විපාක ලැබෙන කර්ම/ මෙලොවදී විපාක ලැබෙන කර්ම / ප්‍රවෘර්ති විපාක ලැබෙන කර්ම

**(ලකුණු 02 යි)**

**(x) අභයගිරි හා ජේතවන ස්තූප ගොඩනැංවූ රජවරුන් දෙදෙනාගේ නම් පිළිවෙළින් ලියන්න.**

අභයගිරි ස්තූපය:- වලගම්බා / වට්ටගාමිණී අභය

ජේතවන ස්තූපය:- මහසෙන් / මහාසේන

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙක දෙන්න.**

**(ලකුණු 02යි)**

**2. (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් මාර්ග අංග දෙකක් නම් කරන්න.**

1. සම්මා දිට්ඨි - නිවැරදි දැකීම
2. සම්මා සංකප්ප - නිවැරදි කල්පනාව
3. සම්මා වාචා - නිවැරදි වචන
4. සම්මා කම්මන්ත - නිවැරදි ක්‍රියා
5. සම්මා ආජීව - නිවැරදි ජීවිකාව
6. සම්මා වායාම - නිවැරදි උත්සාහය
7. සම්මා සති - නිවැරදි සිහිය
8. සම්මා සමාධි - නිවැරදි සමාධිය

**එක් කරුණක් නම් කිරීමට ලකුණු එකයි.**
**කරුණු 2 ක් නම් කිරීමට ලකුණු දෙක දෙන්න.**
**(ලකුණු 02 යි)**

**(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාව යටතේ බෙදා දක්වන්න.**

| | | |
|---|---|---|
| 1. සම්මා දිට්ඨි - නිවැරදි දැකීම | | ප්‍රඥා |
| 2. සම්මා සංකප්ප - නිවැරදි කල්පනාව | | |
| 3. සම්මා වාචා - නිවැරදි වචන | | ශීල |
| 4. සම්මා කම්මන්ත - නිවැරදි ක්‍රියා | | |
| 5. සම්මා ආජීව - නිවැරදි ජීවිකාව | | |
| 6. සම්මා වායාම - නිවැරදි උත්සාහය | | සමාධි |
| 7. සම්මා සති - නිවැරදි සිහිය | | |
| 8. සම්මා සමාධි - නිවැරදි සමාධිය | | |

**කොටස් තුනම නිවැරදිව බෙදා දක්වා තිබේනම් ලකුණු තුනක් දෙන්න.**
**එක් කොටසකට එක ලකුණ බැගින් ලකුණු තුනයි.**
**(ලකුණු 03යි)**

**(iii) ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.**

ලෞකික ජීවිතයේ සාර්ථකත්වය සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගය බෙහෙවින් ම අදාළ කර ගත හැකිය.

- සම්මා දිට්ඨිය මගින් යහපත් ජීවන ගමනකට මග පාදයි. පිං පව්, හොඳ නරක තේරුම් ගෙන කටයුතු කිරීමට මග පාදයි.
- සම්මා සංකප්ප මගින් අභිජ්ඣා, ව්‍යාපාද, මිත්‍යාදෘෂ්ටියෙන් තොර යහපත් සංකල්පනාවන් ගොඩ නගා ගෙන මෛත්‍රී සහගතව ලෞකික ජීවිතය සකස් කර ගත හැකිය.
- සම්මා වාචා තුළින් බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කතා කිරීම ආදියෙන් තොර සමාජයට විශ්වාසවන්ත චරිතයක් ගොඩ නගා ගත හැකිය.

- සම්මා කම්මන්තයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිච්ඡාචාර, සුරා පාන ආදියෙන් තොර යහපත් පුද්ගල චරිතයක් ගොඩ නැගෙයි.
- සම්මා ආජීවය තුළින් ස්වකීය ලෞකික ජීවිතය සාධාරණ හා ධර්මානුකූල ආර්ථික තත්ත්වයක් ගොඩ නගා ගනී.
- සම්මා වායාම මගින් නිරතුරුවම පාපයෙන් මිදී කුසල් වැඩීමට උත්සාහ කරයි.
- සම්මා සතිය නිරතුරුවම අකුසල කර්මවලින් මිදී, සෑම අවස්ථාවකම මනා සිහියෙන් ක්‍රියා කිරීමට මග පෙන්වයි.
- සම්මා සමාධිය වැඩීමෙන් ජීවන අභියෝග මගින් කැළඹිල්ලකට පත් නොවී, උසස් මානසික මට්ටමක් පවත්වාගෙන යාමට හැකි වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි)**

**3. (i) "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.**

අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ

**ගාථාව සම්පූර්ණයෙන් නිවැරදිව ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.**
**අක්ෂර වින්‍යාසය නොසලකන්න.**
**(ලකුණු 02 යි.)**

**(ii) එම ගාථාවේ තේරුම ලියන්න.**

තමා විසින් කරන ලද පවෙන් තමා අපිරිසිදු බවට පත්වේ. තමා විසින් නොකරන ලද පවෙන් තමා පිරිසිදු බවට පත්වේ. පිරිසිදු අපිරිසිදු බව තමා විසින්ම දත යුතුය. කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

**ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු තුනක් ලබා දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) බුදු දහම හොඳ නරක ක්‍රියාවල වගකීම පුද්ගලයා වෙතම පවරා ඇති බව පැහැදිලි කරන්න.**

- දේව නිර්මාණවාදය ඇතුලු සියලු ආකාරයේ නියතිවාදයන් බැහැර කරන බුදු දහම පුද්ගලයාගේ වගකීම පුද්ගලයා වෙතම පවරා ඇත.
- අධ්‍යාත්මික වශයෙන් පිරිසිදු බව හෝ අපිරිසිදු බව රඳා පවතින්නේ තමා තුළමය. එය අනෙකෙකුට ලබාදිය නොහැකිය.
- කිසියම් පුද්ගලයෙකුට මුහුණ පෑමට සිදුවන දුක් කම්කටොලු හෝ සැප සම්පත් සියල්ලටම හේතු වන්නේ තමා විසින් සිදු කරන ලද පාප කර්ම හෝ පුණ්‍ය කර්ම බව බුදු දහම අවධාරණය කරයි.

- හොඳ නරක ක්‍රියාවල වගකීම පුද්ගලයා වෙතම පවරා ඇති බව කාලාම සූත්‍රයෙන් ද පැහැදිලි වේ.

  "කාලාමයෙනි, මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ දහම් සපුරා ගත්, සමාදම් කොට ගත් තැනැත්තාට අවැඩ පිණිසම, දුක් පිණිසම වන්නේ යැයි යම් කලෙක ඔබට ම වැටහේ නම් එකල්හි එය බැහැර කළ යුතුය." යනාදී වශයෙන් දක්වා ඇති පරිදි ආත්මාවබෝධය තුළින් හොඳ නරක ක්‍රියා විනිශ්චය කළ යුතු බව පැහැදිලි වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**

**(ලකුණු 05 යි.)**

**4. (i) පරාභව සූත්‍රයේ දැක්වෙන පිරිහීමේ කරුණු දෙකක් ලියන්න.**

- ධර්මයට අකමැතිවීම
- අසත්පුරුෂයන් ප්‍රියවීම
- සත්පුරුෂයින් ප්‍රිය නොකිරීම
- අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම
- නිතර නිදනසුලු බව (නිද්‍රාශීලීබව)
- නිශ්ඵල කථාවෙන්ම දවස ගෙවීම (සභාශීලී බව)
- උත්සාහයෙන් තොරවීම
- අලසකම
- ක්‍රෝධ කරන බව (කිපෙනසුලු බව)
- මහලුවියට පත් දෙමාපියන්ට නොසැලකීම
- මහණ බමුණන් බොරුවෙන් රැවටීම
- රස බොජුන් තනිව වැළඳීම
- මානයෙන් උදම් වී ඥාතීන් පහත් කොට සැලකීම
- ස්ත්‍රීන් කෙරෙහි ලොල්වීම
- සුරාව කෙරෙහි ලොල්වීම
- සූදු කෙලියෙහි ලොල්වීම
- වෛශ්‍යාවන් සේවනය කිරීම
- පරඹුවන් කරා යාම
- වයසක පුද්ගලයකු ලාබාල තරුණියක සරණ පාවා ගැනීම
- නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම
- ධනයෙන් හීන, තෘෂ්ණාවෙන් යුතු ක්ෂත්‍රියයකු රජකම පැතීම

**මේ අතුරින් ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙක ලබා දෙන්න.**

**(ලකුණු 02 යි.)**

**(ii) මංගල සූත්‍රයේ දැක්වෙන මඟුල් කරුණු තුනක් සැකෙවින් දක්වන්න.**

- අනුවණයින් ඇසුරු නොකිරීම / බාලයන් ඇසුරු නොකිරීම.
- නුවණැත්තන් ඇසුරු කිරීම / පණ්ඩිතයන් ඇසුරු කිරීම.

- පිදිය යුත්තන් පිදීම
- සුදුසු පෙදෙසක විසීම
- පෙර කරන ලද පින් ඇති බව
- සීලාදී ගුණ ධර්මයන්හි පිහිටීම
- බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව / බහුශ්‍රැත බව
- ශිල්ප ශාස්ත්‍රයන්හි ප්‍රගුණ බව
- විනය ගරුක බව
- ප්‍රිය මනාප වචන කථා කිරීම
- මව්පියන්ට උපස්ථාන කිරීම
- අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
- නිවැරදි කාය කර්මයන්හි යෙදීම
- දන්දීම
- ධර්මානුකූලව හැසිරීම
- ඥාතීන්ට සංග්‍රහ කිරීම
- නිවැරදි ජීවන වෘත්තීන්හි යෙදීම
- පාපයෙහි නොඇලීම
- පවින් වැලකීම
- රහමෙර පානය නොකිරීම
- කුසල කර්මයන්හි අප්‍රමාදීවීම
- ගරු කළ යුත්තන්ට ගෞරව කිරීම
- යටහත් පැවතුම් ඇති බව
- ලද දෙයින් සතුටුවීම
- කළ ගුණ දන්නා බව
- සුදුසු කල්හි ධර්ම ශ්‍රවණය කිරීම
- ඉවසීම
- අවවාද පිළිගැනීම
- ශ්‍රමණයන් වහන්සේලා දැකීම
- සුදුසු කල්හි ධර්ම සාකච්ඡා කිරීම
- තපස
- බ්‍රහ්ම චර්යාව
- ආර්ය සත්‍ය දැකීම
- නිවන පසක් කිරීම
- අටලෝ දහම්හි කම්පා නොවීම
- සෝක රහිත බව
- කෙලෙස් නැති බව
- නිර්භයවීම

**ඕනෑම කරුණු තුනක් නම් කර ඇත්නම් ලකුණු තුනක් දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) පුද්ගල ජීවිතයේ පරිහානිය වලක්වා ගනිමින් සාර්ථකත්වය ලඟාකර ගැනීම සඳහා මංගල සූත්‍රාගත කරුණු ඉවහල් කර ගත හැකි ආකාරය පහදන්න.**

- පුද්ගල ජීවිතයේ පරිහානිය වලක්වා ගනිමින් සාර්ථකත්වය ලහා කර ගැනීම සඳහා මංගල සූත්‍රාගත කරුණු ඉවහල් කරගත හැකිය. මංගල සූත්‍රයෙහි මඟුල් කරුණු 38 ක් ඉදිරිපත් කෙරේ. එම කරුණු මෙලොව හා පරලොව දියුණුව සඳහා ඉවහල් වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත.
- මංගල සූත්‍රයේ දැක්වෙන්නේ උපතේ සිට මරණය දක්වා මෙන්ම නිවන් අවබෝධය දක්වා ද අනුගමනය කළ යුතු කරුණු සමූහයකි. මෙම කරුණු එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ හැකි ප්‍රායෝගික කරුණු වේ.

- බාලයන් ඇසුරු නොකොට නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, දෙමාපියන්ට උපස්ථාන කිරීම, නිවැරදි කර්මාන්තයන්හි යෙදීම, රහමෙර පානයෙන් වැලකීම, ලද දෙයින් සතුටු වීම, ධර්මානුකූලව දිවි ගෙවීම වැනි දෛනික ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන කරුනු එහි ඇතුළත් වේ.

**මංගල කරුණු තුනක්වත් ආශ්‍රයෙන් ලියූ පිළිතුරකට සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.**
**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05 යි.)**

**5. (i) බුද්ධ ප්‍රතිමාවල දක්නට ලැබෙන ආසන දෙකක් නම් කරන්න.**

1. වීරාසනය
2. භද්‍රාසනය
3. පද්මාසනය

**එක කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(ii) සඳකඩපහණ පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.**

- ශ්‍රී ලාංකේය කැටයම් ශිල්පියාගේ විස්මිත කලා කෞශල්‍යය ලොවට හෙළි කරන නිර්මාණයක් ලෙස සඳකඩපහණ අගය කළ හැකිය.
- බෞද්ධ සිද්ධස්ථානයකට හෝ රාජකීය ගොඩනැගිලිවලට පිවිසෙන පියගැට පෙළ ආරම්භයේ දක්නට ලැබෙන අර්ධ කවාකාර ගල් පුවරුව සඳකඩපහණ නමින් හැඳින්වේ.
- පාලි භාෂාවෙන් "අඩ්ඪචන්දපාසාණ" නමින් හැඳින් වේ.
- අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා, ඒ ඒ යුගවලට අනන්‍ය ලක්ෂණ ප්‍රකට කරමින් සඳකඩපහණ නිර්මාණය වී ඇත. අනුරාධපුර බිසෝ මාලිගය අසල ඇති සඳකඩපහණ වඩාත් කලාත්මක නිර්මාණය ලෙස සැලකේ.
- අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණින් භව චක්‍රය සංකේතවත් කෙරෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසයි.
- හින්දු බලපෑම නිසා පොළොන්නරු යුගයේ සඳකඩපහණින් ගවයා ඉවත්ව ඇත.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.**
**කෙටි හැඳින්වීමක් තිබේනම් ලකුණු තුනක් දෙන්න.**
**(ලකුණු 03 යි.)**

**(iii) ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය බුද්ධ ප්‍රතිමා කලාව ඇසුරෙන් පහදන්න.**

- ශ්‍රී ලාංකේය කලා ශිල්පියා විවිධ මාධ්‍ය එනම් කළු ගල්, බදාම, දැව වර්ග, කිරිගරුඬ, ඇත් දළ, ලෝහ වර්ග ආදිය උපයෝගී කරගෙන විවිධ ඉරියව් පිළිබිඹු කරන ආකාරයෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත.
- හිටි, හිඳි, ඔත් සහ සක්මන් විලාසය නිරූපණය කරන බුද්ධ ප්‍රතිමා ඒ අතර ප්‍රධාන වේ.
- බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව, මහා ප්‍රඥාව ආදි ආධ්‍යාත්මික ගුණයන් නිරූපණය වන පරිදි ගණ වනාන්තරවල ඇති සිත් පිත් නැති කළු ගල්වල බුද්ධ ප්‍රතිමා නිර්මාණ කර ඇත.

- අවුකන, මාළිගාවිල, පොළොන්නරු ගල් විහාරය වැනි ස්ථානවල දක්නට ලැබෙන හිටි පිළිම වලින් ද තන්තිරිමලේ, පොළොන්නරු ගල් විහාරය වැනි ස්ථානවල ඇති ඔත් පිළිම වලින් හා අනුරාධපුරයේ සමාධි පිළිමය, තොළුවිල සමාධි පිළිමය, පොළොන්නරු ගල් විහාරයේ හිඳි පිළිමය, වැනි හිඳි පිළිම වලින් ද හෙළ කලාකරුවාගේ කලා කෞශල්‍යය මනාව ප්‍රකට කෙරේ.

- ප්‍රතිමා නිර්මාණයේ දී භාවිත කළ මුද්‍රා හා ආසන ප්‍රකට කරන්නේ ද හෙළ කලා කරුවාගේ අසහාය කලා කෞෂල්‍යයයි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි.)**

**6. (i) පළමු ධර්ම සංගායනාවට තුඩුදුන් සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය ලියන්න.**

"ඇවැත්නි, නොහඬව්, නොවැලපෙව්, අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මැනෙවින් මිදුනෝ වෙමු."

" ඇවැත්නි, නොහඬන්න. සෝක නොකරන්න. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෙමු."

**මෙම අදහස ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.**
**(ලකුණු 02යි.)**

**(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ සහ අනුග්‍රහය ලබාදුන් රාජ්‍ය පාලකයා නම් කරන්න.**

**පළමු සංගායනාව පැවැත් වූ ස්ථානය :** රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාද්වාරය අභියස/ රජගහ නුවර වේභාර පර්වතය පාමුල/ රජගහ නුවර සප්තපර්ණී ගුහද්වාරයේදී/ සප්තපර්ණී ගුහාද්වාරයේදී/ රජගහ නුවරදී

**මූලිකත්වය ගෙන ක්‍රියාකළ මහරහතන් වහන්සේ :** මහාකාශ්‍යප මහරහතන් වහන්සේ/ මහාකාශ්‍යප හිමි

**අනුග්‍රහය ලබා දුන් පාලකයා :** අජාසත්ත රජතුමා

**එක් කරුණකට ලකුණ බැගින් ලකුණු තුනක් දෙන්න.**

**(ලකුණු 03 යි.)**

**(iii) ධර්ම සංගායනාවන්හි ප්‍රධාන අරමුණ ශාසන සුරක්ෂිතතාව තහවුරු කිරීම බව පළමු සංගායනාව ඇසුරින් පහදන්න.**

- ධර්ම විනය දෙකෙහි අනාගත සුරක්ෂිතතාව ඇතිකරලීමේ අරමුණු පෙරදැරි කරගෙන ථේරවාදී සංගායනා පවත්වා ඇත. ධර්ම විනය දෙකට පටහැනි සාවද්‍ය කරුණු, දුර්මත ආදිය සංගායනාවකදී බැහැර කෙරේ.
- පළමුවන සංගායනාවේදී මේ සඳහා මූලික පියවර ගැනුණි. බුදුරජාණන් වහන්සේ අවුරුදු හතළිස් පහක් මුළුල්ලේ නොයෙක් ස්ථානයන්හිදී දේශනා කොට වදාළ විසිරී පැවතුනු ධර්මය විධිමත් ලෙස ගොනු කරනු ලැබුයේත්, ඒ ඒ ධර්ම කොටස් මුඛ පරම්පරාගතව රැකගෙන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණක පරම්පරාවලට පවරනු ලැබුවේත්, මෙම ධර්ම සංගායනාවේදීය.
- සූත්‍ර පිටකය නිකාය පහකට ද විනය පිටකය කොටස් පහකට ද බෙදා මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාම සඳහා භාර කෙරුණි.

- එසේම සුභද්‍ර භික්ෂුව වැනි දුර්මතධාරී භික්ෂූන් නිහඬ කිරීම ද මෙම සංගායනාව මගින් සිදුවිය.
- කුඩා අනු කුඩා ශික්ෂාපද වෙනස් නොකොට ආරක්ෂා කිරීමට ගත් තීරණය ද ශාසන චිරස්ථිතිය සඳහා ඉවහල් විය.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05 යි.)**

**7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.**
(i) දුටුගැමුණු මහරජතුමා
(ii) ත්‍රිලක්ෂණය
(iii) වීර්ය පාරමිතාව
(iv) මහනුවර යුගයේ චිත්‍ර කලාව

**දුටුගැමුණු රජතුමා**

රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජතුමාගේ හා විහාරමහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා ගාමිණී කුමාරයා ය. තිස්ස කුමාරයා ඔහුගේ සොහොයුරා විය. විදේශීය සතුරු බලවේගයන්ට නතුව පැවති අනුරාධපුර රාජධානිය ඉන් මුදවා ගැනීමේ දැඩි උනන්දුවක් ගැමුණු කුමාරයා සතුව පැවතුනි. තම පියරජතුමා සමග අමනාප වූ මොහු කාලයක් කොත්මලේ ප්‍රදේශයේ විසූ බව සඳහන් වේ. පිය රජතුමාගේ ඇවෑමෙන් රුහුණේ පාලකයා බවට පත් වූ මොහු මවගේත් භික්ෂූන් වහන්සේලාගේත් ආශීර්වාදයෙන් එළාර නම් සොළී පාලකයා සමග සටන් කොට සිරිලක එක්සේසත් කළේය. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවේ." යන ආදර්ශ පාඨය පෙරටු කරගෙන ක්‍රියාකළ මේ රජතුමා රුවන්වැලි මහා සෑය, මිරිසවැටි ස්තූපය, ලෝවාමහාප්‍රාසාදය හා තවත් වෙහෙර විහාර හැට අටක් ද, ආරෝග්‍ය ශාලා හා ගිලන් හල් ආදිය ද ඉදි කළේය. ලෝක ශාසනය කෙරෙහි අනුපමේය සේවයක් ඉටුකළ, ඉතා සැදැහැති දුටුගැමුණු රජතුමාගේ නාමය ශ්‍රී ලංකා ඉතිහාසයෙහි රන් අකුරින් ලියවී ඇත.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**

**ත්‍රිලක්ෂණය**

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. අනිත්‍ය යනු වෙනස්වනසුලු බවයි. එනම් ලොව ඇති සියල්ල මොහොතින් මොහොත වෙනස්වන බව හෙවත් ස්ථිරසාර පැවැත්මක් නොමැති බවයි.
දුක්ඛ යනු දුක් සහිත බවයි. සැපදායකයයි සලකන සියලු වින්දනයන් තාවකාලිකය. එසේම අනිත්‍යය. ඒ නිසාම දුක් හට ගනී.
අනාත්ම යනු ආත්මයක් නොමැති බවයි. එනම් නිත්‍ය වූ, ස්ථිර වූ, නොවෙනස්ව පවතින ආත්මයක් නොමැත යන්නයි. සියල්ල අනිත්‍ය බවත්, ඒ නිසාම දුක් සහිත බවත්, අනිත්‍ය වූ දුක් සහිත වූ කිසිවක ආත්ම වශයෙන් ගත හැකි කිසිවක් නොමැති බවත් බුදු දහම අවධාරණය කරයි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**

**(ලකුණු 05යි.)**


[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

## වීර්ය පාරමිතාව

දස පාරමිතා ධර්ම අතර පස්වැන්න වීර්ය පාරමිතාව වේ. උතුම් බලාපොරොත්තුව ඉටු වන තෙක් නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම වීර්ය යි. තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව තමන්ගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස ගන්නා බලවත් උත්සාහය වී වීර්ය පාරමිතාවයි. බෝසත් උතුමෝ තුන් ආකාරයකින් වීර්ය පාරමිතාව පූරණය කරති.

- බාහිර වස්තුවලට ආශාවෙන් අත් නොහරින වීර්ය
- ශරීරාංගවලට ආශාවෙන් අත්නොහරින වීර්ය
- ජීවිතයට ආශාවෙන් අත් නොහරින වීර්ය

යනාදි ත්‍රිවිධ අවස්ථාවන් පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී ලෙස දැක් වේ. අප මහ බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව පූරණය කළ ආකාරය වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**

## මහනුවර යුගයේ චිත්‍ර කලාව

අනුරාධපුර හා පොළොන්නරු යුගවල පැවති චිත්‍ර සම්ප්‍රදායට වෙනස් වූ නව ශෛලියකින් නිර්මාණය වූ සිතුවම් කලාවක් මහනුවර යුගයේ දක්නට ලැබේ. මෙම යුගයේ චිත්‍ර ඇඳීම රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංශ දෙකින් යුක්තව සිදු කර ඇත. ඒ අනුව රූපවල බාහිර රේඛා ඇඳ අනතුරුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීම සිදු වී ඇත. චිත්‍ර ඇඳීමේදී රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩියෙනුත් නිල්, කොළ වර්ණ අඩුවෙනුත් භාවිත කර ඇත.
සත්ත්ව, මිනිස් ආදී රූප හා ගස් වර්ග ස්වාභාවික ආකාරයෙන් ඇඳීම මේ යුගයේ සම්ප්‍රදාය නොවිය. දෙගල්දොරුව විහාරය, මැදවල විහාරය, රන්ගිරි දඹුලු විහාරය, බඹරගල විහාරය, කැළණියේ පැරණි විහාර මන්දිරය ආදී තැන්වල මේ යුගයට අයත් චිත්‍ර දක්නට ලැබේ. දෙවරගම්පොළ සිල්වත් තැන, හිරියාලෙ නයිදෙ, දේවේන්ද්‍ර මූලාචාරියා ආදීහු මේ යුගයට අයත් චිත්‍ර ශිල්පීහු වෙති. බුද්ධි ගෝචර නොවන දෘශ්‍ය ගෝචර රටාවකින් චිත්‍ර ඇඳීම මේ යුගයේ විශේෂ ලක්ෂණයකි.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.**
**(ලකුණු 05යි.)**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න